සැ. යු. - 2011.12.16 වැනි දින පළවූ අංක 1,737 දරන ගැසට් පත්‍රයේ I-III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,738 - 2011 දෙසැම්බර් මස 23 වැනි සිකුරාදා - 2011.12.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | –– |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | –– |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 1010 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | 1012 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1022 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 දෙසැම්බර් මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 දෙසැම්බර් මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# රජයේ නිවේදන

අංකය : ප්‍ර. නො. 11/2/35/37/2011 පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2011.12.23 වැනි දින සිට 2012.01.06 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2012.01.13 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,  
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,  
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,  
බත්තරමුල්ල.

*උපලේඛනය*

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "බී" දරන කොට්ඨාසයේ 199 වෙළුමේ 01 පත්‍රිරුව | බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, රාගම් පත්තුවේ, අළුත්කුරු කෝරළයේ වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත් දැලතුරු යන ගම පිහිටි වත්තබොඩ කුඹුර නොහොත් මාදන්ගහවෙල නමැති ඉඩමේ කැබලි අංක ඒ දරන බිම් කොටසට කේ. ඒ. ජේ. බී. පෙරේරා මානක තැනගේ 2006.01.20 වැනි දින අංක 8821 දරන පිඹුරේ ප්‍රකාර මායිම්,<br>*උතුරට* : ජූඩ් ප්‍රනාන්දු, ටී. නිවුටන් ප්‍රනාන්දුට අයත් ඉඩම සහ නෙවිල් බර්නාඩ් පෙරේරාට අයිති ඉඩම කොටස ;<br>*නැගෙනහිරට* : ප්‍රධාන පාර ;<br>*දකුණට* : ගම මැද පාර ;<br>*බස්නාහිරට* : කැලිස්ටස් පෙරේරාගේ උරුමක්කරුවන්ට අයිති ඉඩම ;<br>ප්‍රමාණය : අ. 00, රූ. 01, පර්. 33.81 | 1. ඒ. ඩී. ඒ. අරංගල ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 2006.01.24 වැනි දින අංක 1218 දරන විකුණුම්කරය.<br>2. එම්. ඩී. ඊ. එස්. තිසේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 2010.03.19 වැනි දින අංක 200 දරන විකුණුම්කරය. |

12-807

---

අංකය : ප්‍ර. නො. 11/2/36/2011 පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2011.12.23 වැනි දින සිට 2012.012.06 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2012.01.13 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
| --- | --- | --- |
| මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "ඒ" දරන කොට්ඨාසයේ 109 වෙළුමේ 116 පත්ඉරුව | මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ගඟවට කෝරළෙයේ, නුවර දොඩන්වල අනීවත්ත එස්ටේට් නැමති ඉඩමේ කැබලි අංක ඒ දරන කොටසට බී. එස්. ඒ. කරෝන් මානක තැනගේ 1949.11.20 හා 12.18 දින අංක 1096 දරන පිඹුරේ ප්‍රකාර මායිම් : *නැගෙනහිරට* : මෙම ඉඩමේ ලොට් බී ; *දකුණට සහ දකුණු-බටහිරට* : පාර ; *උතුර-බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ; ප්‍රමාණය : අ. 00, රූ. 01, පර්. 5.5 | 1. එස්. ඊ. ස්පෙන්සර් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1958.05.23 වැනි දින අංක 1092 දරන විකුණුම්කරය.<br>2. ඊ. ඩයස් ඩෙසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1973.08.21 වැනි දින අංක 3484 දරන විකුණුම්කරය.<br>3. පී. එම්. ඩයස් ඩෙසිංහ ප්‍රසිද්ධ නොතාරිස් ලියා සහතික කරන ලද 1983.11.28 වැනි දින අංක 1695 දරන විකුණුම්කරය. |

12-806

---

**ඉඩම් මැනුම් සභාව**

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

**2002 අංක 17 දරන මැනුම් පනතේ**

**43 වැනි වගන්තිය යටතේ වාර්ෂික බලපත්‍ර අත්හිටුවන ලද ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන්ගේ නාම ලේඛනය :**

| | *ලියාපදිංචි අංකය* | *සම්පූර්ණ නම* | *වාර්ෂික බලපත්‍රය නිකුත් කිරීම අත්හිටුවන ලද කාලය* |
| --- | --- | --- | --- |
| (i). | 19700530 | මලිගස්පේ කෝරලේ චාර්ල්ස් ප්‍රේමචන්ද්‍ර | 2012.01.01 සිට 2012.03.31 දක්වා |
| (ii). | 19780876 | වීබද්දආරච්චිලාගේ සේනක සෙල්වින් පෙරේරා | 2012.01.01 සිට 2012.03.31 දක්වා |
| (iii). | 19820070 | ඉරන්දතිස්ස කොටඹගේ | 2012.01.01 සිට 2012.06.30 දක්වා |

එස්. එම්. ඩබ්. ප්‍රනාන්දු,
සභාපති,
ඉඩම් මැනුම් සභාව.

වර්ෂ 2011ක් වූ දෙසැම්බර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

12-845

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## කොළඹ විශ්ව විද්‍යාලය

2010 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

*(අගයන් ආසන්නතම රුපියලට වටයන ලදී)*

| | 2010 රු. | 2010 රු. | 2009 රු. | 2009 රු. |
|---|---|---|---|---|
| *ආදායම :* | | | | |
| *රජයේ ආධාර* | | | | |
| *(අ)* රජයේ ආධාර (පුනරාවර්තන) | 1,06,70,00,000 | | 1,03,26,00,000 | |
| *(ආ)* රජයේ ආධාර - ප්‍රාග්ධන වත්කම් ප්‍රතිසංස්කරණ හා නඩත්තු | 1,12,95,988 | | 1,17,50,808 | |
| *(ඇ)* ප්‍රාග්ධන ප්‍රතිපාදන ක්‍රමක්ෂය | 18,11,43,224 | | 8,87,12,745 | |
| *(ඈ)* ශිෂ්‍යාධාර සඳහා ආධාර | 2,87,64,700 | | 1,90,69,000 | |
| *(ඉ)* මහපොළ සඳහා ප්‍රදානය (i) විවිප්‍රකො | 1,71,77,650 | | 1,78,55,850 | |
| *(ස)* (ii) මහපොළ භාරකාර අරමුදල් සංරචකය (ආදායම) | 11,60,72,300 | **1,42,14,53,863** | 9,34,88,950 | **1,26,34,77,353** |
| ලියාපදිංචි ගාස්තු (ප්‍රථම උපාධි) | 36,36,449 | | 28,80,718 | |
| ලියාපදිංචි ගාස්තු (පශ්චාත් උපාධි) | 8,39,752 | | 9,82,561 | |
| අධ්‍යයන ගාස්තු (ප්‍රථම උපාධි) | 1,00,58,556 | | 2,65,76,804 | |
| අධ්‍යයන ගාස්තු (පශ්චාත් උපාධි) | 39,99,785 | | 69,80,105 | |
| විභාග ගාස්තු (ප්‍රථම උපාධි) | 1,13,105 | | 1,55,400 | |
| විභාග ගාස්තු (පශ්චාත් උපාධි) | 7,21,350 | | 7,88,515 | |
| ණය සහ අත්තිකාරම්වලින් පොළිය | 53,44,774 | | 54,51,399 | |
| ආයෝජන පොළී | 4,14,76,603 | | 5,05,98,867 | |
| ප්‍රකාශන විකිණීම් | 2,400 | | 4,625 | |
| දේපළ කුළී ආදායම් | 10,36,928 | | 11,85,858 | |
| වෛද්‍ය ගාස්තු | 5,71,900 | | 1,52,850 | |
| පුස්තකාල දඩ | 7,65,288 | | 8,20,933 | |
| ව්‍යාපාරික කටයුතුවලින් | 30,85,679 | | 28,38,460 | |
| සුළු මිශ්‍ර ආදායම් | 1,45,19,400 | | 1,24,67,911 | |
| විදේශ විනිමය හුවමාරු ලාභය | - | | 2,26,303 | |
| ගිවිසුම් කඩ කිරීමෙන් ආදායම | 51,68,304 | | 80,69,971 | |
| බාහිර පාඨමාලා ආදායම් | 25,50,65,984 | | 22,69,14,478 | |
| පර්යේෂණ ව්‍යාපෘති අරමුදල් ආදායම් | 15,21,89,438 | | 13,11,70,108 | |
| බාහිර/පර්යේෂණ පාඨමාලා වලින් ආදායම් | 1,41,66,042 | | 2,47,47,335 | |
| ප්‍රදානයන් ලැබීම් | 18,42,683 | **51,46,04,420** | 19,06,136 | **50,49,19,334** |
| | | **1,93,60,58,282** | | **1,76,83,96,687** |
| ***වියදම්*** | | | | |
| *පුද්ගල පඩිනඩි* | | | | |
| වැටුප් හා වේතන | 50,08,50,046 | | 50,34,90,230 | |
| වි. අ. අ./සේ. භා. අ/විශ්‍රාම වැටුප් | 9,72,72,931 | | 9,77,28,271 | |
| දීමනා | 16,61,92,217 | | 14,56,51,892 | |
| අතිකාල/නිවාඩු දින ගෙවීම් | 2,86,33,989 | | 2,87,00,808 | |
| ගමන් වියදම් | 29,99,853 | | 23,05,620 | |
| සැපයීම් | 6,31,83,193 | | 493,90,368 | |
| වත්කම් නඩත්තු | 1,64,49,106 | | 1,30,13,415 | |
| කොන්ත්‍රාත්මය සේවා | 16,61,11,398 | | 15,85,75,482 | |
| වෙනත් | 4,06,58,135 | | 3,88,56,134 | |
| (i) මහපොළ ශිෂ්‍යත්ව - වි. වි. ප්‍ර. කො. | 1,80,04,550 | | 1,73,25,300 | |
| (ii) මහපොළ ශිෂ්‍යාධාර සඳහා ආධාර (වියදම්) | 11,60,72,300 | | 9,34,88,950 | |

| | *2010* | | *2009* | |
|---|---|---|---|---|
| | *රු.* | | *රු.* | |
| ශිෂ්‍යාධාර | 2,87,15,200 | | 1,66,50,300 | |
| ක්ෂය වීම් | 18,11,43,224 | | 8,87,12,745 | |
| පාරිතෝෂික දීමනා වෙන් කිරීම් | 2,35,40,775 | | 1,87,38,702 | |
| බාහිර පාඨමාලා වියදම් | 25,50,65,984 | | 22,69,14,478 | |
| පර්යේෂණ ප්‍රදාන මත වියදම | 15,21,89,438 | | 13,11,70,108 | |
| ප්‍රදානයන් සහ ශිෂ්‍යත්ව | 18,42,683 | | 19,06,136 | |
| විදේශ විනිමය පාඩුව | 2,96,028 | | - | |
| ගොඩනැගිලි (පුනරාවර්තන) (පුනරුත්ථාපන) | 1,12,95,988 | | 1,17,50,808 | |
| කාර්යාලයීය ගෘහභාණ්ඩ හා උපකරණ සඳහා වියදම් ඌන ජනනය කළ අරමුදල | 83,77,456 | 187,88,94,494 | - | 164,43,69,747 |
| **වියදමට වඩා වැඩි ආදායමේ අතිරික්තය** | | **5,71,63,789** | | **12,40,26,940** |
| *ආදායම් හා වියදම් විසර්ජන ගිණුම* | | | | |
| ආදායම් හා වියදම් ගිණුම් ශේෂය | | 5,71,63,789 | | 12,40,26,940 |
| පසුගිය වසර සඳහා ගැලපීම | | (1,65,94,477) | | 1,33,62,134 |
| ආදායම් හා වියදම් ගිණුමේ ශේෂය ඉ/ගෙ/ආ | | (51,94,28,086) | | (65,68,17,160) |
| ශේෂ පත්‍රයට ගෙන ගියා | | (47,88,58,774) | | (51,94,28,086) |

**කොළඹ විශ්වවිද්‍යාලය**

2010 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂ පත්‍රය

| | *2010* | | *2009* | |
|---|---|---|---|---|
| | *රු.* | | *රු.* | |
| **වත්කම් :** | | | | |
| *ජංගම නොවන වත්කම්* | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | | 1,22,20,97,721 | | 1,15,04,38,159 |
| කෙරීගෙන යන වැඩ | | 47,05,53,963 | | 46,49,72,351 |
| ආයෝජන | | 93,20,65,870 | | 67,75,75,541 |
| **ජංගම නොවන වත්කම් - වෙනත් :** | | | | |
| විවිධ ණයගැතියෝ | 99,47,816 | | 69,72,492 | |
| සේවක ණය සහ අත්තිකාරම් | 13,62,81,038 | | 13,61,09,831 | |
| සැපයුම් සේවා ණය | 32,00,709 | | 58,71,072 | |
| විවිධ අත්තිකාරම් | 3,65,610 | 14,97,95,173 | 8,22,622 | 14,97,76,017 |
| **ජංගම් වත්කම් :** | | | | |
| බඩු තොග | 1,11,74,657 | | 64,20,426 | |
| විවිධ ණයගැතියෝ | 6,70,52,517 | | 3,31,99,987 | |
| සැපයුම් සේවා ණය අත්තිකාරම් | 24,62,952 | | 95,17,442 | |
| විවිධ අත්තිකාරම් | 47,80,058 | | 20,51,294 | |
| කලින් ගෙවීම් | 12,49,875 | | 2,72,562 | |
| මුදල් සහ මුදල් හා සමාන දේ | 7,50,83,393 | 16,18,03,450 | 4,39,55,511 | 9,54,17,222 |
| **මුළු වත්කම්** | | **293,63,16,177** | | **253,81,79,290** |
| **ස්කන්ධ ප්‍රාග්ධනය හා බැරකම්** | | | | |
| *ප්‍රාග්ධනය :* | | | | |
| වැය වූ මූලධන ආධාර | 175,59,03,075 | | 1,74,16,21,092 | |
| වැය නොවූ මූලධන ආධාර | 4,51,862 | | (9,52,42,392) | |
| ත්‍යාග හා පරිත්‍යාග | 5,59,25,427 | 181,22,80,364 | 5,26,79,097 | 169,90,57,797 |

| | 2010 රු. | | 2009 රු. | |
|---|---|---|---|---|
| **සමුච්චිත අරමුදල :** | | | | |
| පොදු සංචිතය | 1,89,58,102 | | 1,89,58,102 | |
| ආදායම් සහ වියදම් ගිණුම | (47,88,58,774) | | (51,94,28,086) | |
| වත්කම් යලි තක්සේරු කිරීමේ සංචිතය | 12,94,22,479 | (33,04,78,193) | 6,21,81,349 | (43,82,88,635) |
| **සංචිත සහ නිශ්චිත අරමුදල් :** | | | | |
| විශේෂිත සංචිත | 45,80,65,642 | | 37,37,56,866 | |
| ප්‍රදාන අරමුදල | 6,72,15,023 | | 5,81,77,321 | |
| පර්යේෂණ අරමුදල | 12,01,78,498 | | 14,69,05,516 | |
| බාහිර පාඨමාලා | 36,60,23,680 | | 29,31,77,124 | |
| ත්‍යාග සහ පරිත්‍යාග | 30,214 | | 30,214 | |
| වෙනත් | 1,40,84,271 | 102,55,97,327 | 1,39,97,871 | 88,60,44,912 |
| **ජංගම නොවන වගකීම් :** | | | | |
| පාරිතෝෂික දීමනා වෙන් කිරීම් | 30,57,53,563 | 30,57,53,563 | 30,78,41,213 | 30,78,41,213 |
| **ජංගම නොවන වගකීම් :** | | | | |
| ගෙවිය යුතු ගිණුම් | 88,25,604 | | 2,25,04,766 | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 1,63,06,146 | 2,51,31,750 | 34,77,767 | 2,59,82,533 |
| **ජංගම වගකීම් :** | | | | |
| ගෙවිය යුතු ගිණුම් | 5,84,70,851 | | 1,19,38,988 | |
| උපචිත වියදම් | | | 3,37,63,417 | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | | 9,80,31,367 | 1,18,39,066 | 5,75,41,472 |
| **මුළු වගකීම්** | 3,87,97,923 | **293,63,16,177** | | **253,81,79,290** |
| | 7,62,593 | | | |

පිළියෙල කරන ලද්දේ

ජී. එච්. ගාමිණී,
නියෝජ්‍ය මූල්‍යාධිකාරී.

සහතික කරන ලද්දේ

කේ. එස්. ටී. ස්වර්ණලතා ජයසූරිය,
මූල්‍යාධිකාරී.

පාලක සභාව සඳහා හා ඒ වෙනුවෙන්,

මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම,
උප කුලපති.

ටී. එල්. ආර්. සිල්වා,
වැඩබලන ලේඛකාධිකාරී.

**1. මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් :**

**කොළඹ විශ්වවිද්‍යාලය**

1. *ආයතනික තොරතුරු*

කොළඹ විශ්වවිද්‍යාලය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් ස්ථාපිත කර ඇත. එහි ප්‍රධාන පරිපාලනය කොළඹ 3, කුමාරතුංග මුණිදාස මාවතෙහි, අංක 94 යන ලිපිනයෙහි පිහිටි විද්‍යාල මන්දිරයෙහි සිදු වේ. කොළඹ විශ්වවිද්‍යාලයීය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ 2010 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන වසර සඳහා ය.

2. *විශේෂිත ගිණුම් ප්‍රතිපත්ති*

2.1 *පිළියෙල කිරීමේ පදනම*

කොළඹ විශ්වවිද්‍යාලයීය මූල්‍ය ප්‍රකාශ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත යටතේ භාවිතයට ගැනෙන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූල වන ලෙස ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇත. භාවිතා කර ඇති සියලු මූල්‍ය

ප්‍රතිපත්ති පසුගිය වසරෙහි දී භාවිත මූල්‍ය ප්‍රතිපත්ති හා සැසඳෙන අතර, අවශ්‍ය තැන්හි දී සන්සන්දනය සඳහා අවශ්‍ය අගයන් මෙම වසරෙහි ඉදිරිපත් කිරීම හා සැසඳීමේ දී එකී වෙනස් වීම හා අනුකූල වීම සඳහා ගලපා ඇත.

2.2 *මූල්‍ය තත්ත්වයන් පිළිබඳ ප්‍රකාශන දිනයෙන් පසු සිදු වූ සිදුවීම්*

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයෙන් පසු සිදු වූ සියලු සැලකිය යුතු අවස්ථා සැලකිල්ලට භාජනය කර ඇති අතර, මූල්‍ය ප්‍රකාශනයන්හි අවශ්‍ය තන්හි දී සුදුසු ගැලපීම් හා එළිදරව් කිරීම් සිදු කර ඇත.

2.3 *වත්කම් සහ ඒවායේ වටිනාකම් තක්සේරු කිරීමේ පදනම*

2.3.1 *දේපළ, පිරියත හා උපකරණ, විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ*

වත්කම්, පිරියත හා උපකරණ සහ විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ යටතට රජයේ ආධාර, පර්යේෂණ ආධාර සහ අභ්‍යන්තරව ජනනය කරගත් ප්‍රතිපාදනවලින් මිල දී ගත් ද්‍රව්‍ය ද ඇතුළත් වේ.

2.3.2 *ඉඩම්, ගොඩනැගිලි හා අනෙකුත් වත්කම්*

සම්මුච්චිත ක්ෂය අඩුකර දේපළ, පිරියත හා උපකරණ සහ විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණවල පිරිවැය දක්වා ඇත. වත්කම්වල ඵලදායී ජීවිත කාලය තුළ සරල මාර්ග ක්‍රමය භාවිත කරමින් ක්ෂය ගණනය කර මූල්‍ය ප්‍රකාශවල පෙන්වා ඇත්තේ පහත පරිදි වේ.

| *විස්තරය* | *ඇස්තමේන්තුගත ඵලදායී ආයු කාලය* |
|---|---|
| ගොඩනැගිලි | වසර 20 |
| ගෘහභාණ්ඩ සහ උපකරණ | වසර 10 |
| විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ | වසර 5 |
| සවිකිරීම් හා වැද්දුම් | වසර 10 |
| පුස්තකාල පොත් හා වාර සඟරා | වසර 5 |
| මෝටර් වාහන | වසර 5 |
| උපාධි ලෝගු | වසර 5 |
| වෙනත් වත්කම් | වසර 10 |

ක්ෂය වෙන් කිරීම් අදාළ වත්කම මිලයට ගත් වර්ෂයේසිට එය භාවිත කළ කාල සීමාව මත පදනම් ව එය විකුණා දමන ලද වර්ෂය දක්වා ගණනය කිරීමේ දී. එය අත්පත් කර ගත් මාස සඳහා සම්පූර්ණ ක්ෂය වෙන් කරමින් එය විකුණනු ලබන මාසය සඳහා කිසිදු ක්ෂය වෙන් කිරීමක් සිදු නොකොට ගණනය කර ඇත.

2.3.3 ක්‍රමක්ෂය

මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් සඳහා ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය මත සරල මාර්ග ක්‍රමය යටතේ කරන ලද ක්ෂය හඳුනාගෙන ඇත.

2.3.4 *දේපළ, පිරියත හා උපකරණවල වටිනාකම් යළි තක්සේරු කිරීම*

ශ්‍රී පාලී මණ්ඩපයේ හැර අනෙකුත් ගෘහභාණ්ඩ සහ කාර්යාලයීය උපකරණවල ද, විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණවල ද, වටිනාකම් 2009.12.31 දිනට ද, මෝටර් රථවල වටිනාකම් 2010.12.31 දිනට ද වටිනාකම් තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරු විසින් යළි තක්සේරු කර ඇත.

යළි තක්සේරුව කරණ කොටගෙන ඉහත කී වත්කම්වල පෙන්වන වටිනාකම් 2010.12.31 දිනට රු. 12,94,22,478.90කින් වැඩිවී ඇති අතර එම අතිරික්තය යළි තක්සේරු කිරීම් අතිරික්ත සංචිතය වෙත බැර කරන ලදී.

2.3.5 *වත්කම් මාරුකර යැවීම්*

උපාධි අධ්‍යාපනයේ ආදලත්වය හා තත්ත්වය වර්ධනය කිරීම (IRQUE) පිළිබඳ අයි. ඩී. ඒ. මූල්‍යාධාර සහිත ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කොළඹ විශ්වවිද්‍යාලය වෙත දළ වශයෙන් රුපියල් මිලියන 200ක ප්‍රතිපාදනයක් ප්‍රදානය කර ඇති අතර, ව්‍යාපෘතිය 2010.06.30 වැනි දින අවසන් විය. පස් අවුරුදු කාල සීමාවක් පුරා විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන් සම්බන්ධ ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා මෙම ප්‍රදානය භාවිතා කරන ලදී. ව්‍යාපෘතිය අවසානයේ දී රුපියල් 8,04,81,275.00ක වටිනාකමක් ඇති දැව භාණ්ඩ හා උපකරණ සහ විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ විශ්වවිද්‍යාලය වෙත එවා තිබිණි. මීට අමතරව ව්‍යාපෘතියෙහි ක්‍රියාකාරකම් සඳහා මිලයට ගන්නා ලද රුපියල් 57,50,000.00ක් වටිනා වාහන දෙකක් විශ්වවිද්‍යාලය වෙත එවා තිබිණි.

2.4 *බඩු වට්ටෝරු හා තොග* :

බඩු වට්ටෝරුවල පිරිවැය ගබඩා අත්තිකාරම් ගිණුමෙන් නියෝජනය වේ.

2.5 *ජංගම වත්කම්* :

ශේෂ පත්‍රයෙහි වර්ගීකරණය කරන ලද ජංගම වත්කම් ශේෂ පත්‍ර දිනෙන් පසු වසරක් ඇතුළත පියවා ගනු ලබන වත්කම් වේ.

2.6 *ලැබිය යුතු* :

ගිවිසුම් කඩ කරන ලද සේවකයින්ගෙන් අයවිය යුතු මුදල 2010.12.31 දිනට රු. 4,60,08,958.41කි.

2.7 *ජංගම බැරකම්* :

ශේෂ පත්‍රයෙහි වර්ගීකරණය කරන ලද ජංගම බැරකම් ශේෂ පත්‍ර දිනෙන් පසු වසරක් ඇතුළත පියවනු ලැබීමට නියමිත වගකීම් වේ. හඳුනාගත් සියලු බැරකම් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සැලකිල්ලට ගෙන ඇත.

2.8 *පාරිතෝෂික වෙන් කිරීම්* :

ශේෂ පත්‍ර දිනට 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පිළිබඳ පනත යටතේ විශ්‍රාම පාරිතෝෂික ගෙවීම් සිදු කිරීමට සුදුසුකම් සැපිරීම සඳහා අවශ්‍ය කරන අවම සේවා කාලය අදාල සේවකයන් අතුරින් කිසිවෙකු හෝ කිහිප දෙනෙකු විසින් සම්පූර්ණ කර නොමැති වුවත් සෑම සේවකයෙකුම එම ගෙවීමට හිමිකම් ලබයි යන උපකල්පනයට යටත්ව සියලු අදාල සේවකයන් ශේෂ පත්‍ර දින දී විශ්‍රාම ලබයි නම්, ගෙවිය යුතුවන මුදල මත පාදක කරගෙන පනතට අනුව ගෙවිය යුතු පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශයන්හි වෙන්කිරීම් සිදුකර ඇත.

2.9 *අසම්භාව්‍ය වගකීම්* :

නීතිමය තත්ත්ව පදනම්කොට ගෙන ඇති වන වගකීම් සම්බන්ධයෙන් කිසිදු වෙන් කිරීමක් ගිණුම්වල සිදුකොට නොමැත. 2010 දෙසැම්බර් මස 31 වැනි දිනට ඇස්තමේන්තු කර ඇති මුළු වගකීම රුපියල් මිලියන 3.0කි.

2.10 *ආදායම් හා වියදම්* :

2.10.1 *රජයේ ආධාර* :

ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන සහ විදේශීය හා දේශීය ශිෂ්‍යයන්ගෙන් ලද අධ්‍යයන ගාස්තු අදාල පිරිවැය හඳුනාගත් කාල පරිච්ඡේදය තුළ ආදායම් ලෙස හඳුනාගෙන ඇත. වත්කම් අත්පත් කර ගැනීම සඳහා භාවිතා කරන ලද රාජ්‍ය ප්‍රතිපාදනවලින් වගකීම් අඩුකර එම අගය විලම්භිත ආදායම් ලෙස හඳුනාගෙන තිබේ.

වර්ෂය සඳහා ලද මුළු ප්‍රාග්ධන ප්‍රදානය රුපියල් මිලියන 155ක් වන අතර එය පහත සඳහන් පරිදි භාවිතයට ගෙන තිබේ :-

| | *රු. (මි.)* |
|---|---|
| ගොඩනැගිලි ඉදිකිරීම් | 86 |
| පොත්පත් මිලයට ගැනීම්<br>විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ<br>ලී බඩු හා ඇඳීම් | 36 |
| ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ | 33 |
| | 155 |

2.10.2 *ආදායම් හඳුනාගැනීම* :

(අ) රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන ඒවා ලැබෙන කාලපරිච්ඡේදයේ දී හඳුනාගෙන ඇත. ලැබීම් පදනම මත ලැබෙන ආදායම පමණක් ශිෂ්‍ය අධ්‍යයන ගාස්තු ආදායම ලෙස හඳුනාගෙන ඇත.

(ආ) උපචිත පදනම මත පොලී ආදායම ගිණුම් තබා ඇත.

(ඇ) කොළඹ විශ්වවිද්‍යාලයීය සංවර්ධන අරමුදලට, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රයට, සහ ජාතික අධ්‍යාපන පර්යේෂණ හා ඇගැයීම් කේන්ද්‍රයට අදාල ආයෝජනවලින් පොලී මුදල් වශයෙන් පිළිවෙලින් රුපියල් 1,43,44,339.00, රුපියල් 18,75,749.00 හා රුපියල් 19,19,734.00ක් ලැබී ඇති අතර එම මුදල් එකී අරමුදල්වලට එකතු කර ඇත.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති 29 අනුව පර්යේෂණ, උපදේශක සහ අනෙකුත් බාහිර සේවා සඳහා වැය වූ වියදම් සම්පූර්ණ කළ සේවාව මත පදනම් කර ගෙන ආදායම වශයෙන් සලකා ඇත.

2.10.3 *වියදම් හඳුනාගැනීම :*

(අ) සමාලෝචිත වර්ෂයේ දී රු. 5,71,63,789.00ක අතිරික්තය වෙත එළඹීමේදී ප්‍රථම උපාධි අධ්‍යාපනය වෙනුවෙන් වූ සියලු රජයේ පුනරාවර්තන ආධාරවලට ගිණුම් තබා ඇත.

(ආ) විශ්වවිද්‍යාලයේ ඉගෙනීම් ශක්‍යතාව පවත්වාගෙන යාමට හෝ වර්ධනය කිරීමට ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීමේ දී හෝ ඒවා වැඩිදියුණු කිරීමේදී වැය වූ සියලු වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකා ඇත.

2.11 *ද්‍රවශීලතා තත්ත්වය :*

| | |
|---|---|
| මුදල් හා බැංකු ශේෂය | 7,50,83,393.00 |
| තොග | 1,11,74,657.00 |
| ණය ගැතියෝ | 4,77,93,041.00 |
| ණය හිමියෝ | (5,41,25,742.00) |
| කාරක ප්‍රාග්ධනය | 7,99,25,349.00 |

2.12 *විදේශීය ව්‍යවහාර මුදල් :*

ගණුදෙනුව සිදුවූ දිනට බලපැවැත්වූ අනුපාතය අනුව විදේශීය ව්‍යවහාර මුදල්වලින් සිදුකළ ගනුදෙනු සටහන් කර ඇත. විදේශීය ව්‍යවහාර මුදලින් වන බැංකු ශේෂයන් ශේෂ පත්‍ර දිනට බලපැවැත් වූ විනිමය අනුපාතයට අනුව පරිවර්තනය කර ඇත. සියලු වෙනස්කම් ආදායම් වියදම් ගිණුමට ඇතුළත් කර තිබේ.

2.13 *මුදල් ප්‍රවාහ ප්‍රකාශය :*

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත්තේ වක්‍ර ක්‍රමය භාවිතා කරමිනි.

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**

උපකුලපති,
කොළඹ විශ්වවිද්‍යාලය.

**කොළඹ විශ්වවිද්‍යාලයේ 2010 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

කොළඹ විශ්වවිද්‍යාලයේ 2010 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) සහ 111 වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උප වගන්ති හා සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 *මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම :*

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 *විගණන විෂය පථය සහ මතය සඳහා පදනම :*

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ

ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිළි කිරීම් මා විසින් ලබාගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 *මතය :*

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිළි කිරීම් අනුව, කොළඹ විශ්වවිද්‍යාලය 2010 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් මස 31 වැනි දිනට කොළඹ විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මූල්‍ය ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

2.2 *මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම :*

2.2.1 *මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම :*

සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වූ විගණන නියැදි පරීක්ෂණවල දී අනාවරණය වූ එකතුව රු. 3,58,65,369ක් වූ ගිණුම්කරණ අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත යොමු කරන ලදී. එම ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2011 ජූලි මස 12 වැනි දින නැවත විගණනයට ඉදිරිපත් කරන ලදී. මුදල් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර තිබුනේ දින 61 ප්‍රමාද වී 2011 මැයි මස 02 දින ය.

2.2.2 *ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති :*

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය :-

(අ) සමාලෝචිත වර්ෂයේ බාහිර පාඨමාලා (Extention Courses) සමස්ත අතිරික්තය වූ රු. 36,60,23,680ක් සංචිතවලට මාරුකර තිබූ අතර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 29හි 19 වගන්තියට අනුව එම සමස්ත අතිරික්තයෙන් අවසන් වූ පාඨමාලාවන්ට අදාළ අතිරික්තය, ආදායම් වියදම් ගිණුමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි ;

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 29හි 33 වගන්තියට අනුව බාහිර පාඨමාලාවලට අදාල දළ ආදායම, ආදායම් වියදම් ගිණුමෙහි නොදක්වා බාහිර පාඨමාලාවල අයභාර වියදමට සමාන අගයක් වූ රු. 25,50,65,984ක් ආදායම ලෙස දක්වා තිබුණි ;

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 අනුව 2009 ජූලි මස 22 වැනි දින ඉදිකිරීම් කටයුතු නිමකර භාරදී තිබුණ සේරම් කාන්තා නේවාසිකාගාරය ඉදිකිරීම සඳහා දරන ලද රු. 13,34,18,588 පිරිවැය ප්‍රාග්ධනිත කර නොතිබුණි. තව ද සමාලෝචිත වර්ෂයේ දී ඉහත ගොඩනැගිල්ල භාවිතා කර තිබුණ ද ඒ සඳහා ක්ෂය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

2.2.3 *ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් :*

(අ) ගිවිසුම් කඩ කිරීම වෙනුවෙන් ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ :-

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ 10 පරිච්ඡේදයේ 33 වගන්තිය ප්‍රකාරව ගිවිසුම් කඩ කරන ලද ආචාර්යවරුන් 43ක ගෙන් රු. 4,62,42,958ක මුදලක් සමලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින වන විට අයවිය යුතුව තිබුණි ;

(ii) ආචාර්යවරුන් 04ක ගෙන් අයවිය යුතු රු. 93,82,276ක මුදලක් අයකර ගැනීම සඳහා ඔවුනට විරුද්ධව නඩු පැවරීම සඳහා අදාල ලියකියවිලි නීතිපති දෙපාර්තමේන්තුවට යොමුකර තිබුන අතර ආචාර්යවරුන් 07කගෙන් අයවිය යුතු රු. 18,92,023ක මුදලක් වෙනුවෙන් අධිකරණයේ නඩු විභාග වෙමින් පැවතුණි ;

(iii) ආචාර්යවරුන් 24ක ගෙන් අයවිය යුතු රු. 78,17,611ක මුදලක් ඔවුන්ගේ අර්ථසාධක හා පාරිතෝෂිත අරමුදලින් අයකර ගැනීමට ක්‍රියාකර තිබූ අතර, එම ශේෂයෙන් ආචාර්යවරුන් 15ක ගෙන් අයවිය යුතු එකතු වටිනාකම රු. 15,67,605ක ශේෂයක් අයකර ගැනීමට යෝජිතව වසර 08කට අධික කාලයක් ඉක්මවා තිබුණ ද මෙතෙක් ප්‍රමාණවත් මුදලක් අයකර නොතිබුණි ;

(iv) ගිවිසුම් කඩකිරීම නිසා ආචාර්යවරයකුගෙන් අයවිය යුතු මුළු මුදල වූ රු. 12,18,641කින් රු. 11,01730ක් සමාලෝචිත වර්ෂයට පෙර අයවී තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ දී කිසිදු මුදලක් අයවී නොතිබුණි ;

(**ආ**) වර්ෂය අවසානවන විට එකතු වටිනාකම රු. 9,37,347ක් වූ කල් ඉකුත් වූ ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය සක්‍රිය වැඩ පිළිවෙලක් නොවීය.

2.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් පහත දැක්වේ :-

| *නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව* | *අනුකූල නොවීම* |
|---|---|
| (අ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා 2003 ජූලි මස 18 වැනි දිනැති ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ඇමතූ ලිපිය | අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල්, සේවා නියුක්ත භාර අරමුදල් හා පාරිතෝෂික දීමනා දායකය ගණන් බැලීමේ දී අධ්‍යයන දීමනාව සැලකිල්ලට නොගත යුතු බව දක්වා ඇතත් 2005 ජූලි මස 01 වැනි දිනට පෙර බඳවාගත් අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා එම දීමනාව සැලකිල්ලට ගෙන තිබුණි. |
| (ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99(1) වගන්තිය | සියලු උත්පාදක ආදායම්, පරිත්‍යාග ඇතුළු සියලු අරමුදල් විශ්වවිද්‍යාල අරමුදලට බැර කළ යුතු වුවත් විශ්වවිද්‍යාලය විසින් විවිධ අරමුදල් 156ක් පවත්වාගෙන ගොස් තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම අරමුදල්වල රු. 45,80,65,642ක ශේෂයක් විය. |
| (ඇ) 2002 නොවැම්බර් මස 28 වැනි දිනැති අංක අයිඒඅයි/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග සඳහා විශේෂිත වූ ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ I පරිච්ඡේදයේ 5.2 වගන්තිය හා 2007 අගෝස්තු මස 24 වැනි දිනැති අංක 09/2007 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ආචාර්ය තනතුරක් නොවන තනතුරක් දරන්නෙකු වසර 60 ඉක්මවූ පසු සේවයේ යොදවාගත නොහැකි වුව ද එවැනි නිලධාරීන් 03ක් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවාගෙන තිබූ අතර එම නිලධාරීන්ට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එකතු වටිනාකම රු. 28,48,224ක් පාරිශ්‍රමික ලෙස ගෙවා තිබුණි |
| (ඉ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛක අංක 29/98, 29/98(i), 07/2007, 7/2007(i), 02/2009 හා 1994 ජුනි මස 14 වැනි දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානවලින් බැහැරව විශ්වවිද්‍යාලය විසින් 2003 ජනවාරි මස 01 වැනි දිනට පෙර බඳවාගත් සේවකයින්හට භාෂා ප්‍රවීනතා දීමනාව ගෙවා තිබුණි |
| (ඊ) මු. රෙ. 371 හා උපකුලපතිගේ අංක බී/ඒසී/බීකේ/ඒ දරන 2010 නොවැම්බර් මස 12 දරන ලිපිය | විශ්වවිද්‍යාලයේ සියලු සුළු මුදල් අත්තිකාරම් 2010 දෙසැම්බර් මස 31 වැනි දිනට පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ දී රු. 46,952ක ශේෂයක් පියවා නොතිබුණි. |
| (උ) මු. රෙ. 371(2) | විද්‍යාල මන්දිරය, පර්යේෂණ හා කළමනාකරණ ඒකකය හා ශ්‍රීපාලි මණ්ඩපය විසින් විවිධ කාර්යයන් සඳහා ලබාගත් එකතු වටිනාකම රු. 9,39,626ක් වූ අත්තිකාරම් පියවීම වසර 01 සිට වසර 20ක කාලයක සිට ප්‍රමාද වෙමින් පැවතුණි. |

3. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

3.1 *මූල්‍ය සමාලෝචනය* :

3.1.1 *මූල්‍ය ප්‍රතිඵල* :

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ දායකය ගණන් ගැනීමට පෙර රු. 1,02,11,32,199ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා අනුරූප ඌනතාවය රු. 92,03,23,868ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 10,08,08,331කින් වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා රු. 1,07,82,95,988ක් වූ රජයේ දායකය හේතුකොට ගෙන වර්ෂය සඳහා අතිරික්තය රු. 5,71,63,789ක් වූ අතර, ඉකුත් වර්ෂයේ රු. 1,04,43,50,808ක රජයේ දායකය හේතුකොටගෙන එම වර්ෂයේ අතිරික්තය රු. 12,40,26,940ක් විය.

3.2 *මෙහෙයුම් සමාලෝචනය* ඃ

3.2.1 *කාර්ය සාධනය* ඃ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. ඃ-

(*අ*) 2010 වර්ෂය සඳහා බඳවා ගන්නා ලද උපාධි අපේක්ෂකයින් 2,289ක් වූ අතර 2009 වර්ෂයේ 2,433ක් විය. එක් එක් පීඨ විසින් බඳවාගත් උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව පහත දැක්වේ ඃ-

| *පීඨය* | *වර්ෂය* | |
|---|---|---|
| | *2010* | *2009* |
| කලා | 665 | 661 |
| නීති | 251 | 250 |
| අධ්‍යාපන | 104 | 244 |
| කළමනාකරණ හා මූල්‍ය | 434 | 416 |
| විද්‍යා | 455 | 534 |
| වෛද්‍ය | 230 | 233 |
| ශ්‍රී පාලි මණ්ඩපය | 150 | 95 |
| එකතුව | 2,289 | 2,433 |

ඉහත තොරතුරු විශ්ලේෂණය කිරීමේදී "අධ්‍යාපන පීඨයේ " බඳවාගැනීමේ 57%ක පමණ පසුබෑමක් නිරීක්ෂණය විය.

(*ආ*) සමාලෝචිත වර්ෂය තුළ 2,153 දෙනෙකු විශ්වවිද්‍යාලයෙන් උපාධි ලබා පිටවගොස් තිබූ අතර 2009 වර්ෂයේ එම සංඛ්‍යාව 1,838ක් වූ අතර එක් එක් පීඨයන්ගෙන් උපාධි ලැබූ සංඛ්‍යා පහත දැක්වේ ඃ-

| *පීඨය* | *වර්ෂය* | |
|---|---|---|
| | *2010* | *2009* |
| කලා | 795 | 577 |
| නීති | 212 | 196 |
| අධ්‍යාපන | 112 | 143 |
| කළමනාකරණ හා මූල්‍ය | 348 | 348 |
| විද්‍යා | 394 | 332 |
| වෛද්‍ය | 179 | 193 |
| ශ්‍රී පාලි මණ්ඩපය | 113 | 49 |
| එකතුව | 2,153 | 1,838 |

(*ඇ*) 2010 වර්ෂයේ ලියාපදිංචි මුළු සංඛ්‍යාව 9,359ක් වූ අතර පසුගිය වර්ෂයේ එම ශිෂ්‍ය සංඛ්‍යාව වූ 8,800 සමග සැසඳීමේ දී 441ක අඩුවීමකි. එම ශිෂ්‍ය සංඛ්‍යාව පීඨ අතර බෙදී ඇති ආකාරය පහත දැක්වේ ඃ-

| *පීඨය* | *වර්ෂය* | |
|---|---|---|
| | *2010* | *2009* |
| කලා | 2,249 | 2,785 |
| නීති | 897 | 872 |
| අධ්‍යාපන | 283 | 296 |
| කළමනාකරණ හා මූල්‍ය | 1,650 | 1,621 |
| විද්‍යා | 1,721 | 1,674 |
| වෛද්‍ය | 1,151 | 1,234 |
| ශ්‍රීපාලි මණ්ඩපය | 408 | 318 |
| එකතුව | 8,359 | 8,800 |

(*ඈ*) *දේශන පැය* ඃ

විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව ප්‍රථම උපාධිධාරීන් වෙනුවෙන් 2009/2010 අධ්‍යයන වර්ෂය සඳහා අභ්‍යන්තර දේශන පැය 43,327ක් පවත්වා තිබුණි. පසුගිය වර්ෂයේ එම දේශන පැය සංඛ්‍යාව 35,880කි. ප්‍රථම හා පශ්චාත් උපාධිධාරීන් සඳහා බාහිර දේශන පැය 11,418ක් පවත්වා තිබූ අතර පසුගිය වර්ෂයේ එම දේශන පැය සංඛ්‍යාව 15,888කි.

(*ඉ*) *විභාග පැවැත්වීම* ඃ

සමාලෝචිත වර්ෂය තුළ ප්‍රථම උපාධි විභාග 159ක් ද, පශ්චාත් උපාධි ඩිප්ලෝමා විභාග 25ක් ද, පශ්චාත් උපාධි විභාග 38ක් ද, වෙනත් ඩිප්ලෝමා හා සහතික පත්‍ර විභාග 10ක් ද පවත්වා තිබුණි. ඊට අනුරූපීව පසුගිය වර්ෂයේ ප්‍රථම උපාධි විභාග 143ක් ද,

පශ්චාත් උපාධි ඩිප්ලෝමා විභාග 11ක් ද, පශ්චාත් උපාධි විභාග 19ක් ද, වෙනත් ඩිප්ලෝමා හා සහතික පත්‍ර විභාග 06ක් ද පවත්වා තිබුණි. මේ අනුව පශ්චාත් උපාධි ඩිප්ලෝමා හා පශ්චාත් උපාධි පැවැත්වීම පිළිවෙලින් 127%කින් හා 100%කින් වර්ධනය වීමක් සිදුවී තිබුණි. ඉන් බැහැරව උපාධි අධ්‍යයන පීඨයෙහි සමාලෝචිත වර්ෂයේ දී විධායක ඩිප්ලෝමා විභාග 02ක් ද පශ්චාත් උපාධි ඩිප්ලෝමා විභාග 11ක් හා පශ්චාත් උපාධි විභාග 12ක් ද පවත්වා තිබූ අතර පසුගිය වර්ෂයේ එම පීඨය විසින් පශ්චාත් උපාධි ඩිප්ලෝමා විභාග 16ක් හා පශ්චාත් උපාධි විභාග 07ක් ද, පවත්වා තිබුණි. මේ අනුව පශ්චාත් උපාධි ඩිප්ලෝමා විභාග පැවැත්වීම 31%කින් අඩුවීමක් සහ පශ්චාත් උපාධි විභාග පැවැත්වීම 71%කින් වර්ධනයක් වී තිබුණි.

3.2.2 *කළමනාකරණ අකාර්යක්ෂමතා* :

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ :-

(අ) පර්යේෂණ කටයුතු සවිමත් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විශ්වවිද්‍යාලයේ පර්යේෂණ හා කළමනාකරණ ඒකකයට ලැබී ඇති මුළු මුදල රු. 36,14,54,159ක් වූ අතර වර්ෂයේ වියදම රු. 32,78,58,544ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් විය :-

(i) සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාල කාර්ය සැලැස්මේ 2.6.4 ඡේදය අනුව පර්යේෂණ හා කළමනාකරණ ඒකකය සතුව ප්‍රමුඛ පර්යේෂණ ක්ෂේත්‍ර හඳුනා ගැනීම හා එම ප්‍රමුඛ ක්ෂේත්‍ර සඳහා අරමුදල් ලබාගැනීම සම්බන්ධයෙන් සැලසුමක් පිළියෙල කර නොතිබුණි ;

(ii) කාර්ය සැලැස්මේ 2.6.4 ප්‍රකාරව 2009-2013 සඳහා ඒකාබද්ධ පර්යේෂණ සැලැස්මක් විශ්වවිද්‍යාලය විසින් පිළියෙල කර නොතිබුණි ;

(iii) කාර්ය සැලැස්මේ 2.6.3.1 ප්‍රකාරව පර්යේෂණ කාර්යයන් සවිමත කිරීම වෙනුවෙන් පරිපාලන නිලධාරීන් පුහුණු කිරීම සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකය (SDC) විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) *පුද්ගලික ආයතන වෙතින් ආරක්ෂක සේවා ලබාගැනීම* :

විශ්වවිද්‍යාල ආරක්ෂක කටයුතු කලාප 03කට බෙදා පෞද්ගලික ආරක්ෂක ආයතන මගින් ආදාල සේවාවන් ලබාගන්නා අතර වාර්ෂික එම සේවා වටිනාකම රු. 1,84,21,185ක් විය. 2010 සැප්තැම්බර් මස 20 වැනි දිනැති සේවා පිරිනැමීමේ ලිපිය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8 ඡේදයට අනුව 2010 ඔක්තෝබර් මස 01 වැනි දින අදාල ආරක්ෂක සේවා කොන්ත්‍රාත්තු ආරම්භ වීමට ප්‍රථම දෙපාර්ශ්වය විසින් විධිමත් සේවා ගිවිසුමකට ඇතුළත්ව නොතිබුණි.

(ඇ) ජෛය රසායන අනුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය පවත්වාගෙන යන විශ්වවිද්‍යාලය සතු භූමිය හා රු. 11,68,64,648ක් වූ ගොඩනැගිල්ල එම ආයතනයට පවරා දීමට කටයුතු කර නොතිබුණි.

3.2.3 *අරමුදල් ඌන උපයෝජනය* :

විශ්වවිද්‍යාලයේ පිහිටුවා ඇති අරමුදල් 47ක් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මකව නොතිබුණු අතර එම අරමුදල්වල පැවැති එකතු ශේෂය රු. 6,13,67,495ක් විය. මෙම අරමුදල් වසර 1 සිට 5 දක්වා කාල පරාසයක් තුළ අක්‍රියව පැවැති අතර ශේෂය ඉක්මවා වියදම් දැරීම නිසා එක් අරමුදලක රු. 48,146ක හර ශේෂයක් ද විය.

3.2.4 *අරමුණට පටහැනි ගෙවීම්* :

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99(1) වගන්තිය යටතේ පිහිටුවා ඇති විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලේ අරමුණුගත කාර්යයන්ට පටහැනිව සමලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවලින් බැහැරව පිහිටුවා තිබූ උපකුලපති අරමුදල - 1 වෙත රු. 7,00,000ක් මාරුකර තිබුණි.

**4. පද්ධති හා පාලන**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත වරින්වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු ය :-

(අ) ගිවිසුම්ගත පාලනය ;
(ආ) ගිණුම්කරණය ;
(ඇ) අත්තිකාරම් පියවීම.

එච්. ඒ. එස්. සමරවීර,
විගණකාධිපති.

2011 ඔක්තෝබර් මස 07 වැනි දින,

12-698

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

ඩෙස්ටයින් ප්ලාස්ටික් (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංක : 0013 1000 8954

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 දෙසැම්බර් මස 30 වැනි දින පවත්වන්නට යෙදුනු රුස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී :-

"සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ජී. ඩී. සුනාරි යන අය විසින් ලියා සහිතක කරන ලද 2007 නොවැම්බර් 16 දාතම හා අංක 1867 දරන සහ 2008 ජනවාරි 30 දාතම හා අංක 2003 දරන උකස් බැඳුම්කර මගින් උකස් කොට ඇපකොට මෙහි පළමුවැනි හා දෙවැනි උපලේඛනවල මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් නීතින් යටතේ නිසි ලෙස සංස්ථාගත කොට ඇති සමාගමක් වන ඩෙස්ටයින් ප්ලාස්ටික් (ප්‍රයිවට්) ලිමටඩ් බන්ධනදායීන් වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 1867 සහ 2003 දරන බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් හතලිස් හතර ලක්ෂ අසූ දහස් දෙසිය හැට හයයි ශත තිහක (රු. 44,80,266.30) මුදලක් 2010 සැප්තැම්බර් 01 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හතලිස් හතර ලක්ෂ අසූ දහස් දෙසිය හැට හයයි ශත තිහක (රු. 44,80,266.30) මුදල ද, 2010 සැප්තැම්බර් මස 02 දින සිට අංක 1867 සහ 2003 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හතලිස් තුන් ලක්ෂ විසි හය දහස් එකසිය හැත්තෑ හයයි ශත විසි පහක (රු.43,26,176.25) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි දෙකක් (22%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1867 සහ 2003 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් උකස්කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### පළමුවැනි උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ (කඩුවෙල උප - කාර්යාලය) මාලඹේ පිහිටි "පැලැන්ගහලන්ද" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානකතැන පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර යන අය විසින් සාදන ලද 2006 ජුනි 03 දාතම හා අංක 5948 A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් A ; නැගෙනහිරට : ලොට් C ; දකුණට : අංක 5658 දරන පිඹුරේ ලොට් 2 සහ බස්නාහිරට : අංක 5658 දරන පිඹුරේ ලොට් R1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම නමයයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 12.90) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක. 5948A දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව G1619/248 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානකතැන පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර යන අය විසින් සාදන ලද 2006 ජනවාරි 30 දාතම හා අංක 5658 දරන පිඹුරේ ලොට් R1 වශයෙන් ලකුණුකොට ඇති මාර්ග වෙන් කිරීම දිගේ, ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමග ය.

### දෙවැනි උපලේඛනය

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ (බත්තරමුල්ල උප - කාර්යාලය) උතුරු තලංගම කොස්වත්ත පිහිටි හොරගහකන්ද පාර රුඳපොල වරිපනම් අංක 14/7 C දරන "මිල්ලගහවත්ත නොහොත් පොල්හිටියේවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානකතැන එන්. හේරත් යන අය විසින් සාදන ලද 2006 ජූලි 21 දාතම හා අංක 2006/364 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 3 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : දොළ සහ අංක 1549 දරන පිඹුරේ ලොට් 2 ; නැගෙනහිරට : අංක 1549 දරන පිඹුරේ ලොට් 2 සහ ලොට් R1 ; දකුණට : ලොට් R1 සහ 2 සහ බස්නාහිරට : ලොට් 2 සහ දොළ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නමයයි දශම පහයි පහක් (අක්. 0, රූ. 0, පර්. 9.55) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2006/364 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව G1658/217 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 2006/364 දරන පිඹුරේ ලොට් R1 (අඩි 15ක් පළල පාර සඳහා වෙන් කිරීම) සහ ලොට් D1 සහ බලයලත් මානකතැන එන්. හේරත් යන අය විසින් සාදන ලද 2006 ජුනි 28 දාතම හා අංක 2006/319 දරන පිඹුරේ ලොට් C (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම) දිගේ, ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

එකී අංක 2006/364 දරන එකී පිඹුරේ එකී ලොට් 3, ලොට් R1 සහ ලොට් D1 පහතින් විස්තර කොට ඇති ඉඩම්වල උපබෙදුම් වේ :-

1. එකී කොස්වත්ත පිහිටි "මිල්ලගහවත්ත නොහොත් පොල්හිටියේවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එන්. හේරත් යන අය විසින් සාදන ලද 2006 ජුනි 28 දාතම හා අංක 2006/319 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : දොළ ; නැගෙනහිරට : අංක 1549 දරන පිඹුරේ ලොට් 2 ; දකුණට : ලොට් C සහ A සහ බස්නාහිරට : දොළ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස්තුනයි දශම දෙකයි දෙකක් (අක්. 0, රූ. 0, පර්. 33.22) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්. පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2006/319 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව G1658/84 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. එකී කොස්වත්ත පිහිටි "මිල්ලගහවත්ත නොහොත් පොල්හිටියේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එන්. හේරත් යන අය විසින් සාදන ලද 2006 ජුනි 28 දාතම හා අංක 2006/319 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් C වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් B, නැගෙනහිරට : අංක 1549 දරන පිඹුරේ ලොට් 2, දකුණට : හොරගහකන්ද පාර සහ බස්නාහිරට : ලොට් A යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහයි දශම දෙකයි අටක් (අක්. 0, රූ. 0, පර්. 5.28) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද. වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2006/319 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව G1658/85 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12-846

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2011ක් වූ සැප්තැම්බර් මස 22 වැනි දින පැවැත්වූ රැස්වීමක දී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් සහ ඒකමතිකව සම්මත කර ගන්නා ලදී :-

"නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) නමින් ප්‍රසිද්ධ නොතාරිස් වයි. එන්. දෙල්පෙචිත්‍ර (මහත්මිය) විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2010.06.30 වැනි දින අංක 198 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ දරන ස්ථානයේ පදිංචි ඇන්ටන් වැලන්ටයින් ෆර්නැන්ඩස් (ණයට ගන්නා) විසින් පැහැර හැර ඇති හෙයින් ද, තව ද වර්ෂ 2011ක් වූ අගෝස්තු මස 31 වැනි දිනට එකී බැඳුම්කරය යටතේ බැංකුවට රුපියල් අසූ දෙලක්ෂ අසූඅට දහස් අනූවයි ශත විසිහතක (රු. 82,88,090.27) මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින් ද, 1995 අංක 24 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධිත) පනතින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් (ප්‍රධාන පනත) බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී රුපියල් අසූදෙලක්ෂ අසූ අටදහස් අනූවයි ශත විසිහතක (රු. 82,88,090.27) මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද වර්ෂ 2011 ක් වූ සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා එකී බැඳුම්කරය යටතේ රුපියල් අසූදෙලක්ෂ හැටහත් දහස් එකසිය හතලිස් තුනයි ශත හැත්තෑතුනක (රු. 82,67,143.73) මුදලක් මත වසරකට සියයට පහලොවයි දශම පහක (15.5%) පොළිය ද, ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද ප්‍රධාන පනතේ 13 වැනි වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එය ද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කරය මගින් බැංකුවට උකස්කර ඇති මෙහි පහත විස්තර කරනු ලබන දේපළ සහ පරිශ්‍රය ඇතුළුව නිදහස් අයිතිවාසිකම් සහ අනෙකුත් අයිතිවාසිකම්, හිමිකම් සහ බලපුළුවන්කාරකම් ද බලයලත් වෙන්දේසිකරු වූ පී. කේ. ඊ. සේනාපති මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.".

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ වත්තල ප්‍රාදේශීය සභාවේ වැලිසර උපකාර්යාල සීමාව තුළ වැලිසර හි පිහිටි කහටගහවත්ත, කෝන්ගහවත්ත සහ කජුගහවත්ත යන නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩී. ඩී. සී. ඒ. පෙරේරා විසින් සාදන ලද 2006.11.12 සහ 13 වැනි දිනයන්හි දී අංක 3504B දරන පිඹුර පරිදි මැන බෙදා වෙන්කළ ලොට් 1 දරන ඉඩම් කොටසට මායිම් එනම්, උතුරට : පාරෙන් සහ එම්. එම්. සම්සුදීන්ගේ ඉඩමෙන් ද; නැගෙනහිරට : එම්. එම්. සම්සුදීන්ගේ ඉඩමෙන් සහ ඇෂ්ලි සුරවීරගේ ඉඩමෙන් ද; දකුණට : පිඹුරු අංක 1476හි ලොට් 4 සහ 3 න් සහ බස්නාහිරට: එච්. එන්. ජී. ප්‍රනාන්දු සහ අන් අයට අයත් ඉඩම ද, යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක (අ. 0, රූ. 0, පර්. 10) ඉඩම සමග ඒ තුළ පිහිටා ඇති ගොඩනැගිලි, ගස් කොළන්, වගාවන් ඇතුළු සියලු දේ ද වේ.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී.
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

12-857